*සැ. යු.*- 2014.07.11 දින පළ වූ අංක 1,871 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවී ය.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,872 - 2014 ජූලි මස 18 වැනි සිකුරාදා - 2014.07.18**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 904 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | 911 |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 අගෝස්තු මස 08 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 ජූලි මස 25 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# පළාත් සභා නිවේදන

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාත් සභාව

### මධ්‍යම පළාතේ පළාත් සභාවේ යෝජිත ග්‍රාම සංවර්ධන ප්‍රඥප්ති කෙටුම්පත

මධ්‍යම පළාතේ පළාත් සභාව තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත ඉහත සඳහන් ප්‍රඥප්තියේ කෙටුම්පත මහජනතාවගේ අදහස් විමසීම සඳහා පහත පළ කරමි.

මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවීමෙන් දින 10ක් ඉක්මවා ගිය පසු මෙම කෙටුම්පත අනුමැතිය සඳහා මධ්‍යම පළාත් සභාවට ඉදිරිපත් කරන බව දන්වා සිටිනු ලැබේ. මෙම ප්‍රඥප්තියේ අඩංගු කරුණු සම්බන්ධයෙන් යම්කිසි කරුණක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන්නේ නම් මෙම දැන්වීමෙන් දින 10 තුළ දී එකී කරුණු ලිඛිතව පහත ලිපිනයට මා වෙත දැනුම් දිය යුතු ය.

අමාත්‍ය ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන්,
මධ්‍යම පළාත් ක්‍රීඩා, යෞවන කටයුතු,
වනිතා, ග්‍රාමීය සංවර්ධන හා කර්මාන්ත
කටයුතු පිළිබඳ අමාත්‍යාංශය.

තැ. පෙ. 41,
ගැටඹේ,
පේරාදෙණිය.

### මධ්‍යම පළාත් සභාවේ 2014 අංක....... දරන ග්‍රාම සංවර්ධන ප්‍රඥප්ති කෙටුම්පත

මධ්‍යම පළාත සඳහා ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවක් පිහිටුවීම, ග්‍රාම සංවර්ධන සමිති ලියාපදිංචි කිරීම හා පවත්වාගෙන යාම, ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩල, පළාත් බල මණ්ඩල පිහිටුවීම, ලියාපදිංචි කිරීම හා පවත්වාගෙන යාම, කාන්තා සංවර්ධන මධ්‍යස්ථාන පිහිටුවීම, පවත්වාගෙන යාම සහ විධිමත් කිරීම සඳහා අවශ්‍ය විධි විධාන සැලැස්වීමද, ඇතුළත් මධ්‍යම පළාතේ ග්‍රාම සංවර්ධන හා ඊට සම්බන්ධ අනුෂාංගික කරුණු සඳහා විධි විධාන සඳහා වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය

1. මෙම ප්‍රඥප්තිය මධ්‍යම පළාත් සභාවේ 2014 අංක................. දරන ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර මධ්‍යම පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලද දින සිට ක්‍රියාත්මක වේ.

I කොටස

මධ්‍යම පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවීම

ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවක් පිහිටුවීම

2. මධ්‍යම පළාත තුළ ග්‍රාම සංවර්ධන විෂයට අදාල කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා (මෙහි මින් මතු දෙපාර්තමේන්තුව නමින් හඳුන්වනු ලබන) මධ්‍යම පළාතේ ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව යනුවෙන් හඳුන්වනු ලබන දෙපාර්තමේන්තුවක් පිහිටවනු ලැබිය යුතු ය.

මධ්‍යම පළාත් ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ

3. දෙපාර්තමේන්තුවේ කර්තව්‍යයන් හා බලතල ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා දෙපාර්තමේන්තුවට පළාත් අධ්‍යක්ෂවරයෙකු පළ කළ යුතු වන්නේය. එම තැනැත්තා දෙපාර්තමේන්තු ප්‍රධානියා විය යුතු අතර එම තැනැත්තා මධ්‍යම පළාත් ආණ්ඩුකාරවරයා විසින් පත් කළ යුතු වන්නේ ය. එසේම පළාත් අධ්‍යක්ෂවරයා අදාල අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සාමාන්‍ය පාලනයට හා විධානවලට යටත් වන්නේය.

දෙපාර්තමේන්තුව සඳහා අනෙකුත් නිලධාරීන් පත් කිරීම

4. මෙම ප්‍රඥප්තියේ කර්තව්‍යයන් හා බලතල ඉටු කිරීම සඳහා ග්‍රාම සංවර්ධන පළාත් අධ්‍යක්ෂට සහය වීම පිණිස අවශ්‍ය විය හැකි නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්, සහකාර අධ්‍යක්ෂවරුන් හා වෙනත් නිලධාරීන් හා කාර්ය මණ්ඩලය 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධි විධානවලට අනුකූලව පත් කළ යුතු වන්නේ ය.

බලතල පවරා දීම

5. පළාත් අධ්‍යක්ෂවරයාගේ කර්තව්‍යයන් හා බලතල ඉහත 4 වැනි වගන්තිය යටතේ පත් කරනු ලබන නිලධාරීන් වෙත පවරා දිය හැකි ය.

6. දෙපාර්තමේන්තුවේ පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු ය ;

දෙපාර්තමේන්තුවේ පරමාර්ථ

(අ) ග්‍රාමීය ප්‍රජා දායකත්වය ඇතිව ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති ඉටු කරනු පිණිස ග්‍රාම සංවර්ධන සමිති හා බල මණ්ඩල පිහිටුවීම, පවත්වාගෙන යාම හා බල ගැන්වීම,

(ආ) ග්‍රාමීය ප්‍රජාව මගින් හඳුනාගත් අත්‍යවශ්‍ය යටිතල පහසුකම් ව්‍යාපෘති, ප්‍රජා දායකත්වය යොදා ගනිමින් ක්‍රියාත්මක කිරීම,

(ඇ) තිරසාර ග්‍රාමීය සංවර්ධනයට අවශ්‍ය වන ග්‍රාමීය සමාජ සංවර්ධන ව්‍යාපෘති හා ග්‍රාමීය ආර්ථික උත්පාදන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම,

(ඈ) ග්‍රාමීය නායකත්ව සංවර්ධනයට අවශ්‍ය වන පුහුණුවීම්, දැනුවත් කිරීම් හා සවිබල ගැන්වීම් තුළින් ග්‍රාමීය ප්‍රජාවගේ හා දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය.

7. දෙපාර්තමේන්තුවේ කර්තව්‍ය හා බලතල පහත සඳහන් පරිදි විය යුතුය ;

දෙපාර්තමේන්තුවේ කාර්තව්‍ය හා බලතල

(අ) ග්‍රාම සංවර්ධන සමිති, ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩල, ග්‍රාම සංවර්ධන පළාත් බල මණ්ඩලය පිහිටුවීම, ලියාපදිංචි කිරීම, කළමනාකරණය, අධීක්ෂණය කිරීම, විසුරුවා හැරීම, හා විගණනය කිරීම,

(ආ) ග්‍රාමීය කාන්තා සංවර්ධන මධ්‍යස්ථාන පිහිටුවීම, පාලනය, කළමනාකරණය, පවත්වාගෙන යාම හා අධීක්ෂණය කිරීම,

(ඇ) ග්‍රාමීය කාන්තා සංවර්ධන මධ්‍යස්ථාන තුළින් ප්‍රතිලාභීන් සඳහා අවශ්‍ය වන වෘත්තීය පුහුණුව ලබාදීම හා ස්වයං ව්‍යාපාර සඳහා දිරි ගැන්වීම,

(ඈ) ග්‍රාම සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා ඇගයීම,

(ඉ) මෙම දෙපාර්තමේන්තුවේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය යැයි හැඟෙන සහය රජය, පළාත් සභා, පළාත් පාලන ආයතන හෝ වෙනත් නෛතික පුද්ගලයන්ගෙන් ලබාගැනීම,

(ඊ) ජනතාවගේ ජීවන තත්වය ඉහළ නංවනු ලබන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම,

(උ) ග්‍රාමීය ප්‍රජාවගේ හා දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා අවශ්‍ය වන පුහුණු වැඩසටහන් පැවැත්වීම,

(ඌ) ග්‍රාම සංවර්ධනයට දායක වන රාජ්‍ය, පළාත් සභා, පළාත් පාලන ආයතන සහ රාජ්‍ය නොවන සංවිධාන සමග සම්බන්ධීකරණය පවත්වාගෙන යාම,

(එ) ග්‍රාම සංවර්ධනයට අවශ්‍යවන හඳුනාගත් සමාජ, ආර්ථික, සංස්කෘතික වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම,

(ඒ) යම් ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නියාදනයක් ප්‍රකාරව හෝ වෙනත් යම් ආකාරයකින් එයට පවරනු ලැබිය හැකි යම් චංචල හෝ නිශ්චල දේපළවල සන්තකය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට හා 1987 අංක 42 දරන පළාත් සභා පනතට අනුකූලව දැරීම,

(ඔ) මේ ප්‍රඥප්තියේ නිශ්චිතව දක්වනු ලබන පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම, ක්‍රියාත්මක කිරීම හා ඊට ආනුෂාංගික සියලු කරුණු පිළිබඳව කටයුතු කිරීම,

(ඕ) ග්‍රාම සංවර්ධන සමිති, ප්‍රාදේශීය බල මණ්ඩල, පළාත් බල මණ්ඩලය ඉදිරිපත් කරනු ලබන මූල්‍ය හා ගිණුම් වාර්තා විගණනයට භාජනය කිරීම හා යම් මූල්‍ය අක්‍රමිකතාවක් අනාවරණය වුවහොත් ඒ සම්බන්ධයෙන් අදාල නීතිමය කටයුතු කිරීම.

## II කොටස

### ග්‍රාම සංවර්ධන සමිති

8. පළාත් අධ්‍යක්ෂ විසින් නිශ්චිතව දක්වනු ලබන පරිදි එක් එක් ග්‍රාම නිලධාරි කොට්ඨාසයක් සඳහා හෝ ග්‍රාම නිලධාරි කොට්ඨාසයක යම් කොටසක් සඳහා හෝ ග්‍රාම නිලධාරි කොට්ඨාස කිහිපයක් සඳහා හෝ ග්‍රාම සංවර්ධන සමිති පිහිටවනු ලැබිය හැකිය. ග්‍රාම සංවර්ධන සමිති

9. ග්‍රාම සංවර්ධන සමිතියක අරමුණු විය යුත්තේ ;

ග්‍රාම සංවර්ධන සමිතියක අරමුණු

(අ) සංස්කෘතික හර පද්ධතීන් ප්‍රවර්ධනය කිරීම හා දේශීය අනන්‍යතාවය සුරක්ෂිත කිරීම,

(ආ) ග්‍රාමීය සංවර්ධනයට පාදක වන සමගිය, සහජීවනය හා ආත්ම විශ්වාසයෙන් යුතු ප්‍රජාවකට නායකත්වයක් ලබා දීම,

(ඇ) ග්‍රාමීය විභව ශක්තීන් හඳුනාගෙන පාරිසරික සමතුලිතතාවය ආරක්ෂාවන අයුරින් ග්‍රාමීය ජනතාවගේ සංවර්ධනයට පාදක වන සම්පත් කළමනාකරණයක් ඇති කිරීම,

(ඈ) ජනතාවට අවශ්‍ය යටිතල පහසුකම් ලබාදීම හා වැඩිදියුණු කිරීම ; සහ

(ඉ) පවුල් ඒකකය ශක්තිමත් කිරීම, සමගිය, සහජීවනය, ප්‍රවර්ධනය කිරීම, කාන්තා හා ළමා සංවර්ධනය ඇති කිරීම

ග්‍රාම සංවර්ධන සමිතියක කර්තව්‍ය හා බලතල

10. දෙපාර්තමේන්තුවේ මඟපෙන්වීම හා අධීක්ෂණයට යටත්ව ග්‍රාම සංවර්ධන සමිතියක කර්තව්‍ය හා බලතල විය යුත්තේ,

(අ) සංවර්ධන අවශ්‍යතාවයන් සඳහා ඉඩම්, මුල්‍ය හා වෙනත් භාණ්ඩ, උපකරණ ආදිය පරිත්‍යාග වශයෙන් නිත්‍යානුකූලව ලබා ගැනීම,

(ආ) ඉඩම්/දේපළ මිලදී ගැනීම, බදු ගැනීම, කුලියට ගැනීම හා ඒ සඳහා වන ගිවිසුම්වලට එළඹීම,

(ඇ) සංවර්ධන අවශ්‍යතාවයන් සඳහා ඉඩම් හෝ දේපළ බදු දීම, කුලියට දීම, පැවරීම හා ඒ සඳහා වන ගිවිසුම්වලට එළඹීම.

(ඈ) සංවර්ධන සේවාවන් ඉටුකර ගැනීම සඳහා පළාත් සභා මුල්‍ය රීතීන්ට හා මුල්‍ය චක්‍රලේඛනයන්ට අනුකූලව රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවලින් කොන්ත්‍රාත් ලබා ගැනීමට හා ඒ සඳහා වන ගිවිසුම්වලට එළඹීම.

(ඉ) ග්‍රාම සංවර්ධන සමිතියක අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන්නාවූ ඊට ආනුෂාංගික අනෙකුත් බලතල.

(ඊ) සෑම ග්‍රාම සංවර්ධන සමිතියක්ම එළඹි වර්ෂයේ මාර්තු 31 දිනට ප්‍රථම පෙර වර්ෂයේ සමිතියේ මූල්‍ය තත්වය දැක්වෙන වාර්තාවක් පළාත් ග්‍රාම සංවර්ධන අධක්ෂවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

ග්‍රාම සංවර්ධන සමිති ව්‍යවස්ථාවක විධි විධාන

11. (අ) සෑම ග්‍රාම සංවර්ධන සමිතියකටම, ග්‍රාම සංවර්ධන සමිතියක සංයුතිය, අරමුදල හා ග්‍රාම සංවර්ධන සමිතියක් පවත්වාගෙන යාමට අවශ්‍ය විධි විධාන ඇතුළත් ව්‍යවස්ථාවක් තිබිය යුතු අතර පළාත් අධ්‍යක්ෂවරයාගේ නිර්දේශය මත එම ව්‍යවස්ථාවක අඩංගු විය යුතු පොදු විධි විධාන අමාත්‍යාංශ ලේකම් විසින් කලින් කලට නියම කරනු ලැබිය හැකි ය.

(ආ) සමිතියේ අවශ්‍යතාවයන්ට අනුව පොදු විධි විධානයන්ට පටහැනි නොවන පරිදි සමිති ව්‍යවස්ථාව සකස් කර ගැනීමට සමිතියට හැකියාව ඇත්තේ ය.

ග්‍රාම සංවර්ධන සමිති අරමුදල

12. ග්‍රාම සංවර්ධන සමිති ව්‍යවස්ථාවේ දක්වා ඇති විධි විධානවලට යටත්ව ග්‍රාම සංවර්ධන සමිතියකට, සමිති අරමුදලක් පවත්වාගෙන යා හැකිය. එකී අරමුදල රාජ්‍ය බැංකුවක පවත්වාගෙන යා යුතු ය.

අනෙකුත් විධි විධාන

13. ග්‍රාම සංවර්ධන සමිතියක සංයුතිය, අරමුදල හා ග්‍රාම සංවර්ධන සමිතියක් පවත්වාගෙන යාමට අවශ්‍ය අනෙකුත් විධි විධාන හා ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩල සඳහා සමිති නියෝජනයට අදාළ විධි විධාන ග්‍රාම සංවර්ධන සමිති ව්‍යවස්ථාවේ දක්වනු ලැබිය යුත්තේ ය.

## III කොටස

### ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩල

ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩල

14. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක පිහිටි සියලුම ග්‍රාම සංවර්ධන සමිති ඒකාබද්ධතාවයෙන් මධ්‍යම පළාතේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකටම ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩලයක් පැවතිය යුතුය. එකී ප්‍රාදේශීය බල මණ්ඩලය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ලියාපදිංචි ග්‍රාම සංවර්ධන සමිතිවලින් තෝරා ගන්නා ලද සාමාජිකයින්ගෙන් සමන්විත විය යුතු ය. මේ සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ලියාපදිංචි සෑම ග්‍රාම සංවර්ධන සමිතියකටම එක් නියෝජිතයෙකු බැගින් නම් කිරීමේ හැකියාව ඇත.

15. ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩලයක අරමුණු විය යුත්තේ ;

ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩලයක අරමුණු

(අ) ප්‍රාදේශීය සංවර්ධනය සඳහා එම කොට්ඨාසයේ ප්‍රජාවගේ හා සිවිල් සමාජයේ ක්‍රියාකාරී සහභාගීත්වය ලබා ගැනීම,

(ආ) ග්‍රාම සංවර්ධන සමිති අතර අන්තර් සම්බන්ධතාවය වර්ධනය කිරීම,

(ඇ) කොට්ඨාසයේ ග්‍රාම සංවර්ධන සමිති එකක් හෝ ඊට වැඩි ගණනකගේ ඉල්ලීම මත,

(i) බල මණ්ඩල බල ප්‍රදේශය සඳහා ඒකාබද්ධ සංවර්ධන වැඩ පිළිවෙළක් සැලසුම් කිරීම,
(ii) සමාජ සුභ සාධන සේවාවන් පවත්වාගෙන යාම.

(ඈ) බල මණ්ඩලය විසින් සමාජ සුභසාධන සේවාවන් පවත්වාගෙන යාම, සහ

(ඉ) සාමාජික සමිතිවල ප්‍රාග්ධන හා වෙනත් අවශ්‍යතා සඳහා අරමුදල් ගොඩනැගීම.

16. ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩලයක කර්තව්‍ය හා බලතල විය යුත්තේ, — ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩලයක කර්තව්‍ය හා බලතල

(අ) සාමාජික සමිතිවල කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය උපදෙස් ලබා දීම,

(ආ) සාමාජික සමිතිවල ප්‍රාග්ධන අවශ්‍යතා සපුරා ගැනීම සඳහා අරමුදල් ඇතිකිරීම හා පවත්වාගෙන යාම,

(ඇ) සාමාජික සමිති සඳහා සහනදායි පොලී පදනම මත ණය ආධාර සැපයීම,

(ඈ) ග්‍රාම සංවර්ධන සමිතියකට ඔවුන්ගේ සමිති ව්‍යවස්ථාව අනුව කටයුතු කිරීමට සහය දීම,

(ඉ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ කාන්තා හා ළමා සංවර්ධන කටයුතු ව්‍යාප්ත කිරීම සහ සමාජ සුභ සාධන සේවා පවත්වාගෙන යාම,

(ඊ) සෑම ප්‍රාදේශීය බල මණ්ඩලයක්ම එළැඹි වර්ෂයේ මාර්තු 31 දිනට ප්‍රථම පෙර වර්ෂයේ සමිතියේ මූල්‍ය තත්වය දැක්වෙන වාර්තාවක් පළාත් ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කළ යුතු වේ,

(උ) ඉහත 15 වැනි වගන්තියේ සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අදාළ වන්නා වූ වෙනත් කටයුතු කිරීම.

17. ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩල කැඳවීම හා අධීක්ෂණය දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන සහකාර අධ්‍යක්ෂ හෝ දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන නිලධාරි විසින් සිදු කළ යුතු ය. — කැඳවීම හා අධීක්ෂණය

18. (අ) සෑම ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩලයකටම, ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩලයක සංයුතිය, අරමුදල හා ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩලයක් පවත්වාගෙන යාමට අවශ්‍ය අනෙකුත් විධි විධාන ඇතුළත් ව්‍යවස්ථාවක් තිබිය යුතු අතර පළාත් අධ්‍යක්ෂවරයාගේ නිර්දේශය මත එම ව්‍යවස්ථාවක අඩංගු විය යුතු පොදු විධිවිධාන අමාත්‍යාංශ ලේකම් විසින් කලින් කලට නියම කරනු ලැබිය හැකි ය. — ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩල ව්‍යවස්ථාවක විධි විධාන

(ආ) ප්‍රාදේශීය අවශ්‍යතාවන්ට අනුව පොදු විධිවිධානයන්ට පටහැනි නොවන පරිදි බල මණ්ඩල ව්‍යවස්ථාව සකස් කර ගැනීමට ප්‍රාදේශීය බල මණ්ඩලයට හැකියාව ඇත්තේ ය.

19. ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩල ව්‍යවස්ථාවේ දක්වා ඇති විධිවිධානවලට යටත්ව ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩලයකට, බල මණ්ඩල අරමුදලක් පවත්වාගෙන යා හැකිය. එකී අරමුදල රාජ්‍ය බැංකුවක පවත්වාගෙන යා යුතු ය. — ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩල අරමුදල

20. ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩලයක සංයුතිය, අරමුදල හා ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩලයක් පවත්වාගෙන යාම අවශ්‍ය අනෙකුත් විධි විධාන ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩල ව්‍යවස්ථාවේ දක්වනු ලැබිය යුත්තේය. — අනෙකුත් විධි විධාන

## IV කොටස

### ග්‍රාම සංවර්ධන පළාත් බල මණ්ඩලය

21. මධ්‍යම පළාත සඳහා ග්‍රාම සංවර්ධන පළාත් බල මණ්ඩලයක් පිහිටු විය යුතු ය. — ග්‍රාම සංවර්ධන පළාත් බල මණ්ඩලය පිහිටුවීම

22. මෙහි සාමාජිකත්වය සෑම ප්‍රාදේශීය බල මණ්ඩලයක නම් කරනු ලබන එක් නියෝජිතයෙකු බැගින් සමන්විත විය යුතු වන්නේ ය. — පළාත් බල මණ්ඩලයේ සංයුතිය

ග්‍රාම සංවර්ධන පළාත් බල මණ්ඩලයේ අරමුණු.

23. ග්‍රාම සංවර්ධන පළාත් බල මණ්ඩලයක අරමුණු විය යුත්තේ,

(අ) ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩල හා ග්‍රාම සංවර්ධන සමිති පිළිබඳව මේ ප්‍රඥප්තියේ නිශ්චිතව සඳහන් වන යම් පරමාර්ථයක් ඉටු කර ගැනීමට අවශ්‍ය නායකත්වය සැපයීම හා සහයෝගය දැක්වීම,

(ආ) මධ්‍යම පළාත තුළ ක්‍රියාත්මක වන ග්‍රාම සංවර්ධන වැඩසටහන් අධීක්ෂණය කිරීම, නියාමනය කිරීම සහ ඇගයීම,

(ඇ) මධ්‍යම පළාත තුළ ග්‍රාමීය සංවර්ධනය සඳහා රාජ්‍ය සංවිධානවල හා රාජ්‍ය නොවන සංවිධානවල සහයෝගීතාව සහතික කිරීම, සහ

(ඈ) මධ්‍යම පළාත තුළ ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩලවල වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම,

(ඉ) මධ්‍යම පළාත තුළ පිහිටුවා ඇති කාන්තා ග්‍රාම සංවර්ධන මධ්‍යස්ථාන කටයුතු සම්බන්ධීකරණය හා ප්‍රවර්ධනයට අවශ්‍ය සහය ලබා දීම.

පළාත් බල මණ්ඩලයේ කර්තව්‍ය හා බලතල.

24. ග්‍රාම සංවර්ධන පළාත් බල මණ්ඩලයේ කර්තව්‍ය හා බලතල විය යුත්තේ,

(අ) මධ්‍යම පළාත තුළ ග්‍රාම සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති පිළිබඳ අධ්‍යයනය,

(ආ) ග්‍රාම සංවර්ධන වැඩසටහන් ක්‍රියාවට නැගීමේ දී අවශ්‍ය කරනු ලැබිය හැකි පරිදි පළාත තුළ වෙනත් යම් රාජ්‍ය, රාජ්‍ය නොවන සහ පෞද්ගලික ආයතන සමග සම්බන්ධීකරණය පැවැත්වීම,

(ඇ) මධ්‍යම පළාත තුළ ග්‍රාම සංවර්ධන වැඩසටහන් කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාදේශීය බල මණ්ඩල විසින් ඉදිරිපත් කරන යෝජනා සහ අදහස් සලකා බැලීම සහ ඒවා දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම, සහ

(ඈ) අවම වශයෙන් වසරකට තෙවරක් ප්‍රගති සමාලෝචන රැස්වීම් කැඳවීම සහ ප්‍රගති සමාලෝචන වාර්තා සකස් කිරීම,

(ඉ) පළාත් බල මණ්ඩලය එළඹි වර්ෂයේ මාර්තු 31 දිනට ප්‍රථම පෙර වර්ෂයේ බල මණ්ඩලයේ මූල්‍ය තත්වය දැක්වෙන වාර්තාවක් පළාත් ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

ග්‍රාම සංවර්ධන පළාත් බල මණ්ඩල ව්‍යවස්ථාව.

25. (අ) ග්‍රාම සංවර්ධන පළාත් බල මණ්ඩලයට, ග්‍රාම සංවර්ධන පළාත් බල මණ්ඩලයක සංයුතිය, අරමුදල හා ග්‍රාම සංවර්ධන පළාත් බල මණ්ඩලයක් පවත්වාගෙන යාමට අවශ්‍ය විධි විධාන ඇතුළත් ව්‍යවස්ථාවක් තිබිය යුතු අතර, පළාත් අධ්‍යක්ෂවරයාගේ නිර්දේශය මත එම ව්‍යවස්ථාවේ අඩංගු විය යුතු පොදු විධි විධාන අමාත්‍යාංශ ලේකම් විසින් කලින් කලට නියම කරනු ලැබිය හැකි ය.

(ආ) පළාත් බල මණ්ඩලයේ අවශ්‍යතාවයන්ට අනුව පොදු විධි විධානයන්ට පටහැනි නොවන පරිදි බල මණ්ඩල ව්‍යවස්ථාව සකස් කර ගැනීමට බල මණ්ඩලයට හැකියාව ඇත්තේ ය.

ග්‍රාම සංවර්ධන පළාත් බල මණ්ඩල අරමුදල.

26. ග්‍රාම සංවර්ධන පළාත් බල මණ්ඩල ව්‍යවස්ථාවේ දක්වා ඇති විධි විධානවලට යටත්ව ග්‍රාම සංවර්ධන පළාත් බල මණ්ඩලයට, බල මණ්ඩල අරමුදලක් පවත්වාගෙන යා හැකිය. එකී අරමුදල රාජ්‍ය බැංකුවක පවත්වාගෙන යා යුතු ය.

අනෙකුත් විධි විධාන.

27. ග්‍රාම සංවර්ධන පළාත් බල මණ්ඩලයේ සංයුතිය, අරමුදල හා ග්‍රාම සංවර්ධන පළාත් බල මණ්ඩලය පවත්වාගෙන යාමට අවශ්‍ය අනෙකුත් විධි විධාන ග්‍රාම සංවර්ධන පළාත් බල මණ්ඩල ව්‍යවස්ථාවේ දන්වනු ලැබිය යුත්තේ ය.

කැඳවීම හා අධීක්ෂණය.

28. ග්‍රාම සංවර්ධන පළාත් බල මණ්ඩලය කැඳවීම හා අධීක්ෂණය පළාත් අධ්‍යක්ෂ විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජ්‍ය හෝ සහකාර අධ්‍යක්ෂවරයෙකු විසින් සිදු කළ යුතු ය.

## V කොටස

## ග්‍රාම සංවර්ධන සමිති හා බල මණ්ඩල ලියාපදිංචි කිරීම

ග්‍රාම සංවර්ධන සමිති හා බල මණ්ඩල ලියාපදිංචි කිරීම.

29. සෑම ග්‍රාම සංවර්ධන සමිතියක්ම ප්‍රාදේශීය බල මණ්ඩලයක්ම සහ පළාත් බල මණ්ඩලය පළාත් අධ්‍යක්ෂ යටතේ ලියාපදිංචි විය යුතු ය.

ලියාපදිංචි කිරීමේ රෙගුලාසි.

30. 29 වන වගන්තිය යටතේ ලියාපදිංචි කිරීමේ රෙගුලාසි විෂයභාර අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි ය.

31. 30 වන වගන්තියේ සඳහන් රෙගුලාසි මගින් දැක්වෙන විධි විධානවලට අනුකූලව ග්‍රාම සංවර්ධන සමිති, ප්‍රාදේශීය හා පළාත් බලමණ්ඩල විසින් ලියාපදිංචිය සඳහා පළාත් අධ්‍යක්ෂක වෙත අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය. ලියාපදිංචිය සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීම.

32. ලියාපදිංචිය සඳහා ග්‍රාම සංවර්ධන සමිතියක්, ප්‍රාදේශීය බල මණ්ඩලයක් හා පළාත් බල මණ්ඩලයක් විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත් ලියාපදිංචි අවශ්‍යතා සපුරා ඇති බවට පළාත් අධ්‍යක්ෂවරයා සෑහීමට පත් වේ නම් එම සමිතිය හෝ බල මණ්ඩලය ලියාපදිංචි කළ යුතු ය. ලියාපදිංචි සහතික නිකුත් කිරීම.

33. ග්‍රාම සංවර්ධන සමිතියක්, ප්‍රාදේශීය බල මණ්ඩලයක්, හෝ පළාත් බල මණ්ඩලය විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත් ලියාපදිංචි අවශ්‍යතා සපුරා නොමැති බව පළාත් අධ්‍යක්ෂවරයාට පෙනී යන්නේ නම් ලියාපදිංචිය ප්‍රතික්ෂේප කළ හැකි ය. ලියාපදිංචිය ප්‍රතික්ෂේප කිරීමට තුඩුදුන් හේතු අදාල සමිතිය හෝ බල මණ්ඩලය වෙත ප්‍රතික්ෂේප කිරීම කළ දින සිට දින 14 ක් ඇතුළත ලිඛිතව දන්වා යැවිය යුතු ය. ලියාපදිංචිය ප්‍රතික්ෂේප කිරීම.

34. ලියාපදිංචිය සඳහා ඉදිරිපත් වූ අයදුම්පතක් ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධ අභියාචනයක් ලියාපදිංචිය ප්‍රතික්ෂේප කල දින සිට දින 30 ක් තුළ අමාත්‍යාංශ ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ හැකි ය. ඒ සම්බන්ධ ලේකම්වරයාගේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක වන්නේ ය. අභියාචනා බලතල.

35. ග්‍රාම සංවර්ධන සමිතියක්, ප්‍රාදේශීය බල මණ්ඩලයක්, හෝ පළාත් බල මණ්ඩලය ලියාපදිංචි වීම හේතු කොට ගෙන එය ලියාපදිංචි කරනු ලැබූ නාමය යටතේ, අවිච්චින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති එසේම දේපළ අත්පත් කර ගැනීමේ ද, ගිවිසුම්වලට ඇතුළත් වීමේ ද, නඩු හා වෙනත් නීති කෘති පැවරීමේ හා ඒවා සම්බන්ධයෙන් නිදහසට කරුණු කීමේද බලය සහිත සංස්ථාවක් වන්නේ ය. ලියාපදිංචි කල ග්‍රාම සංවර්ධන සමිති හා බල මණ්ඩල සංස්ථා විය යුතු බව.

## VI කොටස

## ග්‍රාමීය කාන්තා සංවර්ධන මධ්‍යස්ථාන

36. පළාත තුළ ජීවත්වන ග්‍රාමීය කාන්තාවන්ගේ ආර්ථික ශක්තිය හා හැකියාව වර්ධනය කරනු පිණිස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ග්‍රාමීය කාන්තා සංවර්ධන මධ්‍යස්ථාන පිහිටුවනු ලැබිය හැකිය. මෙම මධ්‍යස්ථාන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ පවත්වාගෙන යා යුතු ය. කාන්තා සංවර්ධන මධ්‍යස්ථාන පිහිටුවීම.

37. ග්‍රාමීය කාන්තා සංවර්ධන මධ්‍යස්ථාන මගින් ග්‍රාමීය කාන්තාවන්ට වෘත්තීය නිපුණතාවය සඳහා අවශ්‍ය වන නිපුනතා සංවර්ධන පාඨමාලා පැවැත්විය හැකි ය. වෘත්තීය පුහුණු පාඨමාලා.

38. කාන්තා සංවර්ධන මධ්‍යස්ථාන සඳහා පුහුණුවන්නන් තෝරා ගැනීම, පාඨමාලා තීරණය කිරීම හා පවත්වාගෙන යාම පළාත් අධ්‍යක්ෂ විසින් හෝ ඔහු විසින් බලය පවරන නිලධාරියෙකුට කළ හැක්කේ ය. පුහුණුවන්නන් තෝරාගැනීම සහ පාඨමාලා තීරණය කිරීම.

## VII කොටස

## පොදු විධි විධාන

39. දෙපාර්තමේන්තුවේ කටයුතු වඩා පුළුල් හා ඵලදායී කිරීම සඳහා දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන කාර්යාල මහනුවර, මාතලේ, නුවරඑළිය දිස්ත්‍රික්ක තුළ ආරම්භ කළ යුතුයි. එම කාර්යාල සඳහා සහකාර අධ්‍යක්ෂවරයෙක්, දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන නිලධාරිවරයෙක් සහ සෙසු කාර්ය මණ්ඩලය අනුයුක්ත කල යුතුයි. ප්‍රඥප්තියට අදාල රෙගුලාසි පැනවීම.

40. (අ) ඉහත 7 වැනි වගන්තියේ සඳහන් දෙපාර්තමේන්තුවේ කර්තව්‍ය හා බලතල ක්‍රියාත්මක කිරීම සඳහාත්,

(ආ) සමිති, ප්‍රාදේශීය බල මණ්ඩල සහ පළාත් බල මණ්ඩලයේ කර්තව්‍යන් හා බලතල ක්‍රියාත්මක කිරීම සඳහාත් ඉහත 30 වන වගන්තියේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සඳහාත්,

අවශ්‍ය වන රෙගුලාසි පැනවීමට අමාත්‍යවරයාට බලය ඇත.

(ඇ) ග්‍රාම සංවර්ධන සමිති, ප්‍රාදේශීය බල මණ්ඩල, හා පළාත් බල මණ්ඩලයේ විගනන කටයුතු කිරීමේ බලය පළාත් ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ වෙත පැවරේ. ඉහත විගණනයේ දී යම් මූල්‍ය වංචාවක් අනාවරනය වුවහොත් ඒ සම්බන්ධ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ බලය අධ්‍යක්ෂවරයාට පැවරේ. විගණනයේ දී අනාවරණය වන එවැනි වංචාවන් පිළිබඳ අධ්‍යක්ෂවරයා දෙන සහතිකය එම තැනැත්තාගෙන් හෝ එම තැනැත්තාගෙන් අයවීමට ඇති මුදල පිළිබඳ තීරණාත්මක සාක්ෂියක් වනු ඇත.

41. ඉහත 40 වගන්තිය යටතේ පනවනු ලබන සෑම රෙගුලාසියක්ම අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කළ යුතු අතර, පළ කළ දින සිට මාස 03 ක් ඇතුළත පළාත් සභාවට ඉදිරිපත් කර සම්මත කරගත යුතු ය.

42. (අ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස බල ප්‍රදේශය තුළ ග්‍රාම සංවර්ධන සමිති හා ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩල පිහිටුවීම, ලියාපදිංචිය, හා විගණන කාර්යය ඉටු කිරීමේ දී එය ග්‍රාම සංවර්ධන නිලධාරි විසින් ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය යටතේ විය යුතු ය.

*(ආ)* ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස බල ප්‍රදේශය තුළ ග්‍රාම සංවර්ධන සමිති හා ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩලවල කටයුතු ඉටු කිරීමේ දී අක්‍රමිකතා හා විෂමාචාර අනාවරණය වුවහොත් එම සමිති හා ප්‍රාදේශීය බල මණ්ඩල, පළාත් ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ හා අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය මත විසුරුවා හැරීමට අමාත්‍යවරයාට බලය ඇත.

වැරදි හා දඬුවම්.

43. (i) මෙම ප්‍රඥප්තියේ යම් විධි විධානයක් හෝ ප්‍රඥප්තිය යටතේ පනවන ලද රෙගුලාසියක් හෝ යම් රීතියක විධි විධානයක් උල්ලංඝනය වනසේ ක්‍රියාකරන යම් තැනැත්තෙකු හෝ යම් තැනැත්තන් මෙම ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන අතර, නිසි අධිකරණ බලයක් ඇති අධිකරණයක් යටතේ නඩු විභාගයකින් වරදකරු කිරීමේ දී රුපියල් දෙදහස් පන්සියයක් නොයික්මවන දඩයකට හෝ මාස 06 ක් නොයික්මවන කාලයක් සඳහා දෙආකාරයකින් එක් ආකාරයකට බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

(ii) යම් ග්‍රාම සංවර්ධන සමිතියක හෝ ප්‍රාදේශීය බල මණ්ඩලයක හෝ පළාත් බල මණ්ඩලයේ මූල්‍ය වංචාවන් හෝ මුදල් අවභාවිතයක් පිළිබඳව අධිකරණයට වාර්තා කළ පසු එම වංචාවට හා අවභාවිතයට අදාළ මුදල එම අධිකරණය මගින් අය කරනු ලබන දඩ මුදලක් ආකාරයෙන් අයකොට අදාළ ග්‍රාම සංවර්ධන සමිති ගිණුමට/ප්‍රාදේශීය බල මණ්ඩල ගිණුමට/පළාත් බල මණ්ඩල ගිණුමට බැර කළ යුතු ය. එසේ ම මෙම පනත මගින් අයකරනු ලබන සියලු දඩමුදල් මධ්‍යම පළාත් සභාවේ අරමුදලට බැරකල යුතු ය.

සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුබව.

44. මෙම ප්‍රඥප්තියේ සිංහල පාඨය, දෙමළ පාඨය හා ඉංග්‍රීසි පාඨය අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් සිංහල පාඨයේ අදහස බලාත්මක වන්නේ ය.

## අන්තර්කාලීන විධි විධාන

ධුරය දරන පළාත් අධ්‍යක්ෂවරයා සහ කාර්ය මණ්ඩලය තවදුරටත් පවත්නා බව.

45. නියමිත දිනට පෙරාතුව සිට පළාත් අධ්‍යක්ෂවරයා ලෙස සේවය කරන පුද්ගලයා මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා 3 වන වගන්තිය යටතේ පත්කල අධ්‍යක්ෂවරයා වශයෙන් සලකනු ලැබිය යුතු අතර, නියමිත දිනට පෙරාතුව සිට දෙපාර්තමේන්තුවේ සේවය කරන නිලධාරීන් ඉහත 4 වගන්තියේ සඳහන් නිලධාරීන් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

වත්කම්, වගකීම් හා බැඳීම් ඉදිරියට පවත්වාගෙන යාම.

46. *(අ)* නියමිත දිනට පෙරාතුව සිට ක්‍රියාත්මක වූ ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව සතුව පැවති සියලු වත්කම්, වගකීම්, සියලු ණය බැඳීම්, නඩු කටයුතු සහ එම දෙපාර්තමේන්තුව සමග එළඹ ඇති කොන්ත්‍රාත් ගිවිසුම් සියල්ල මෙම ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද දෙපාර්තමේන්තුව යටතේ පවතින වත්කම්, වගකීම්, සියලු ණය බැඳීම්, නඩු කටයුතු හා ගිවිසුම් ලෙස සලකනු ලැබිය යුතු ය.

*(ආ)* නියමිත දිනට පෙරාතුව සිට ක්‍රියාත්මක වූ ග්‍රාම සංවර්ධන සමිති හා ප්‍රාදේශීය බල මණ්ඩල සතුව පැවති සියලු වත්කම්, වගකීම්, සියලු ණය බැඳීම්, නඩු කටයුතු සහ එම සමිති හා ප්‍රාදේශීය බල මණ්ඩල සමග එළඹ ඇති කොන්ත්‍රාත් ගිවිසුම් සියල්ල මෙම ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද සමිති හා ප්‍රාදේශීය බල මණ්ඩල යටතේ පවතින වත්කම්, වගකීම්, සියලු ණය බැඳීම්, නඩු කටයුතු හා ගිවිසුම් ලෙස සලකනු ලැබිය යුතු ය.

47. මහනුවර, මාතලේ, නුවරඑළිය දිස්ත්‍රික්ක කාර්යාලවලට කාර්ය මණ්ඩල බඳවාගන්නා තෙක් දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන නිලධාරීන් විසින් දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන කාර්යාල පවත්වාගෙන යා යුතු ය.

## අර්ථ නිරූපනය

අර්ථ නිරූපනය.

48. පද සම්බන්ධයෙන් අන්‍ය අර්ථයක් අවශ්‍ය වුවහොත් මිස,

"ආණ්ඩුකාරවරයා" යන්නෙන් අදහස් වන්නේ මධ්‍යම පළාත් ආණ්ඩුකාරවරයා ය.

"අමාත්‍යවරයා" යන්නෙන් අදහස් වන්නේ මධ්‍යම පළාත් සභාවේ ග්‍රාම සංවර්ධන විෂයභාර අමාත්‍යවරයා ය.

"අමාත්‍යාංශ ලේකම්" යන්නෙන් අදහස් වන්නේ මධ්‍යම පළාත් සභාවේ ග්‍රාම සංවර්ධන විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් ය.

"ප්‍රාදේශීය ලේකම්" යන්නෙන් අදහස් වන්නේ මධ්‍යම පළාත තුළ පිහිටි යම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් භාරව ක්‍රියා කරන ප්‍රාදේශීය ලේකම් වරයා ය.

"පළාත් අධ්‍යක්ෂ" යනුවෙන් අදහස් වන්නේ මධ්‍යම පළාත් ග්‍රාම සංවර්ධන පළාත් අධ්‍යක්ෂවරයා ය.

"නියෝජ්‍ය අධ්‍යක්ෂ"යනුවෙන් අදහස් වන්නේ මධ්‍යම පළාත් ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ විසින් බලය පවරන ලද නියෝජ්‍ය ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂවරයා ය.

"සහකාර අධ්‍යක්ෂ" යනුවෙන් අදහස් වන්නේ මධ්‍යම පළාත් ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ විසින් බලය පවරන ලද සහකාර ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂවරයා ය.

"දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන නිලධාරි" යනුවෙන් අදහස් වන්නේ මධ්‍යම පළාත් ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ විසින් බලය පවරන ලද අදාළ දිස්ත්‍රික්කයේ ග්‍රාම සංවර්ධන කටයුතු ඉටු කරනු ලබන නිලධාරියා වේ.

"ග්‍රාම සංවර්ධන නිලධාරි" යනුවෙන් අදහස් වන්නේ මධ්‍යම පළාත් ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ විසින් බලය පවරන ලද අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම සංවර්ධන කටයුතු ඉටු කරනු ලබන නිලධාරියා වේ.

"සමිති" යන්නෙන් අදහස් වන්නේ මධ්‍යම පළාත තුළ ක්‍රියාත්මක වන ග්‍රාම සංවර්ධන සමිති වේ.

"බල මණ්ඩල" යන්නෙන් අදහස් වන්නේ මධ්‍යම පළාත තුළ ක්‍රියාත්මක වන ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩල හා ග්‍රාම සංවර්ධන පළාත් බල මණ්ඩලය වේ.

"දේපළ" යන්නෙන් අදහස් වන්නේ ග්‍රාම සංවර්ධන සමිති හෝ ග්‍රාම සංවර්ධන බල මණ්ඩල සතු පොත්පත්, ලේඛන, අත ඉතිරි හා බැංකුගත මුදල්, ලීබඩු, උපකරණ, ගොඩනැගිලි හා ඉඩකඩම් ව්‍යාපෘති හා චංචල නිශ්චල යන සියලුම දේපළ ය.

"ව්‍යවස්ථාව" යන්නෙන් අදහස් වන්නේ මධ්‍යම පළාත් අමාත්‍ය මණ්ඩලය අනුමත කරනු ලබන ග්‍රාම සංවර්ධන සමිති ව්‍යවස්ථාව, ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩල ව්‍යවස්ථාව හා පළාත් බල මණ්ඩල ව්‍යවස්ථාව වේ.

"රාජ්‍ය බැංකුවක්" යන්නෙන් අදහස් වන්නේ මුල්‍යමය නීති පනතේ රාජ්‍ය බැංකුව යන අර්ථයම ගැනේ.

"රාජ්‍ය නොවන ආයතන" යන්නෙන් අදහස් වන්නේ ස්වේච්ඡා, සමාජ සේවා ආයතන (ලියාපදිංචිය හා අධීක්ෂණය) පනත යටතේ ලියාපදිංචි වී ඇති ස්වෙච්ඡා සංවිධානයක් වේ.

"පළාත් මුල්‍ය රීති" යන්නෙන් අදහස් වන්නේ 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 19(5) සහ 23 වගන්තිය යටතේ මධ්‍යම පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවා 2008 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන මුල්‍ය රීතීන් වේ.

"නියමිත දිනය" යන්නෙන් අදහස් වන්නේ මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනය වේ.

"කාන්තා සංවර්ධන මධ්‍යස්ථාන" යනු ග්‍රාමීය කාන්තාව සවිබල ගැන්වීම සඳහා වෘත්තීය නිපුනතාවයන් ලබාදීම පිණිස පිහිටවනු ලබන පුහුණු මධ්‍යස්ථානයන් වේ.

07-450

# අතුරු ව්‍යවස්ථා

**සම්මත අතුරු ව්‍යවස්ථා**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වැනි අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ දකුණු පළාතේ, පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඔහු විසින් සාදනු ලැබූ හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අක 1811 හා 2013.05.17 දිනැති *ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ නිවේදනය කරනු ලැබූ දකුණු පළාතේ මහා නගර සභා බල ප්‍රදේශ තුළ සියලු සම්මත අතුරු ව්‍යවස්ථාවලට අදාළ අර්ථ නිරූපනය පිළිබඳ අතුරු ව්‍යවස්ථා, සියලුම සම්මත අතුරු ව්‍යවස්ථාවලට අදාල පොදු විධිවිධාන පිළිබඳ අතුරු ව්‍යවස්ථා, කිසියම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන හෝ නියමයන් උල්ලංඝනය කිරීම සම්බන්ධ දඬුවම් පිළිබඳ අතුරු ව්‍යවස්ථා, සභා රැස්වීම්වල කටයුතු කරගෙන යාම පිළිබඳ අතුරු ව්‍යවස්ථා, මාළු විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව, මස් විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා, සිසිල් බීම කර්මාන්ත ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථා, කොණ්ඩා සැකසීමේ ස්ථාන, බාබර් සාප්පු හා සැලූන් හල් සහ රූපලාවන්‍ය මධ්‍යස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථා, බේකරි පිළිබඳ අතුරු ව්‍යවස්ථා, කිරි පට්ටි පිළිබඳ අතුරු ව්‍යවස්ථා, පිහිණුම් තටාක පිළිබඳ අතරු ව්‍යවස්ථාව, අයිස් කර්මාන්ත ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථා, බත්කඩ, ආපනශාලා සහ තේ හෝ කෝපි කඩ පිළිබඳ අතුරු ව්‍යවස්ථා, හෝටල් පිළිබඳ අතුරු ව්‍යවස්ථා, නවාතැන් පොළවල් පිළිබඳ අතුරු ව්‍යවස්ථා, ලොන්ඩරි පිළිබඳ අතුරු ව්‍යවස්ථා, කර්මාන්ත ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථා, අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථා, සංචාරක වෙළෙඳුන් විසින් ආහාර පාන ද්‍රව්‍ය වෙළෙඳාම් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා, පදික මාරු ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථා, ඉදිකිරීම් ද්‍රව්‍ය ආශ්‍රිත කර්මාන්ත ස්ථාන හා ඉදිකිරීම් ද්‍රව්‍ය ගබඩා ස්ථාන විධිමත් කිරීම, අධීක්ෂණය හා පාලනය පිළිබඳ අතුරු ව්‍යවස්ථා, වාහන නතර කිරීම හා වාහන හැසිරවීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා, මාර්ගවලට අලාභහානි කිරීම සහ මාර්ගවල ගමනාගමනයට බාධා කිරීම වැළැක්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා, ආදාහනාගාර විධිමත් කිරීම, පාලනය කිරීම හා ගාස්තු අයකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා, පොදු වෙළෙඳපොල පවත්වාගෙන යාම පිළිබඳ අතුරු ව්‍යවස්ථා, ක්‍රීඩා භූමි පිළිබඳ අතුරු ව්‍යවස්ථා, ප්‍රජා ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථා, ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව, උකස් හා උකස් හිමියන් ලියාපදිංචි කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා, යන කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා දකුණු පළාතේ, පළාත් සභාව විසින් 2013.07.23 දින පවත්වන ලද පළාත් සභා රැස්වීමේ දී ඒකමතිකව ස්ථිර කරනු ලැබූ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමන් දර්ශන පාඬිකෝරාල,
ලේකම්,
දකුණු පළාතේ පළාත් සභාවේ පළාත් පාලන අමාත්‍යාංශය.

2014 මාර්තු මස 30 වැනි දින.

07-530

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.